# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ ළමා පෝෂණ ඌනතාවය

එන්. කේ. අයි. ටී. නමුණුකුල[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. මෙහි මූලික ආර්ථික රටාව අනාදිමත් කාලයක සිට කෘෂිකර්මය බව ජාතික ආදායම් ප්‍රතිශතාත්මක අගය පිරික්සීමේදී තවමත් සාක්ෂි දරයි. පවුලක ආදායම, එම පවුල ඒකකය තුළ පෝෂණය කෙරෙහි බලපෑමක් තිබෙනවා ද යන්න සහ ළමා පෝෂණය ඊට බලපෑමක් කරන්නේ ද යන්න විමසුම කාලෝචිත මාතෘකාවකි. ළමා පරපුර මන්දපෝෂණය හේතුකොටගෙන විවිධ වූ ලෙඩ රෝගවලට ගොදුරු වෙමින් පවතී. මෙහි තීව්‍රතාව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ද දැකිය හැකිය. මොණරාගල, කිලිනොච්චිය, අනුරාධපුරය, පොළොන්නරුව පමණක් නොව මාතලේ, මහනුවර, නුවරඑළිය යන මධ්‍යම පලාතට අයත් දිස්ත්‍රික්කවල ද දැකගත හැකිය. රටක දරුවන්ගේ පෝෂණය මැනෙන දර්ශක ලෙස උපත් බර, වයසට නිසි බර, උසට සරිලන බර (බී.එම්.අයි දර්ශකය) රුධිරයේ ඇති යකඩ ප්‍රතිශතය වැනි කරුණු විමසීමෙන් තීරණය කළ හැකිය. ශ්‍රී ලංකාවේ වර්තමාන දුෂ්පෝෂණ දර්ශකය 20% සිට 40% අතර පවතී. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ළමා පෝෂණ ඌනතාවය කෙරෙහි බලපාන්නේ ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණකි. මව් කුසක සිටින දරුවාගේ සිට දරුවන්ට ලබාදෙන ආහාර පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මව ගන්නා අහාර, කුඩා දරුවන්ට ලබාදෙන ආහාර ප්‍රමාණාත්මක ද ගුණාත්මක ද එය නිසි කලට ලබාදෙනවා ද යන්න පිළිබඳවත් අවධානය යොමුකළ යුතු ය. මේ පිළිබඳව විමසීමේදී, වතුකරයේ ජනතාවට ඉහත කරුණු සමඟ කටයුතු කළ හැකි ද යන්න ගැටලුවකි. ඔවුනගේ රැකියාව, ආදායම දරුවාගේ පෝෂණ ඌනතා ඇති වීමට සෘජු සබඳතාවක් දක්වන බව නොඅනුමානය. මෙම අධ්‍යයනය සඳහා පුවත්පත්, සෞඛ්‍ය අමාත්‍යාංශ වාර්තා, මහ බැංකු වාර්තා වැනි ද්විතීක දත්ත පරිශීලනය කෙරුණි. දරිද්‍රතාවය ස්වායත්ත විචල්‍ය ලෙස ගෙන ළමා පෝෂණය පරායත්ත විචල්‍ය ලෙස ගනිමින් සහසම්බන්ධතාව ගණනය කළ අතර එමඟින් දරිද්‍රතාවය හා ළමා පෝෂණය අතර සෘණ සහසම්බන්ධතාවක් පවතීය යන කල්පිතය පිළිගැනීමට හැකි විය. ඒ අනුව දරිද්‍රතාවය වැඩිවන විට ළමා පෝෂණය අඩුවන බව ගම්‍ය විය.

**මුඛ්‍ය පද :** දරිද්‍රතාවය, ළමා පෝෂණය, ශ්‍රී ලංකාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinuthathsarani05@gmail.com